# මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම

## ඇබෑර්තු

සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම ශ්‍රී ලංකාවේ රසායන නිෂ්පාදනයෙහි හා අලෙවිකරණයේ නියැලි, රජය සතු ලාභ උපදවන ස්වයංධාරීත සංවිධානයකි. පහත දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමට යෝග්‍ය පුද්ගලයින් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## ගබඩා නිලධාරී තනතුර (JM 1-1) තනතුරු 01 යි

**තනතුරෙහි වගකීම්**

* ගබඩාවේ නිසි නඩත්තුව සහතික කරලීම
* නිමි නිෂ්පාදන අයිතමයන් පිළිබඳ නිසි තොග මට්ටම් පවත්වා ගැනීම.
* කාර්යාල සඳහා ගබඩා සහ වෙනත් අවශ්‍ය සැපයුම් සඳහා වගකීම
* සංඛ්‍යාතමය හා මූල්‍යමය වාර්තා පවත්වා ගැනීම
* නැව්ගත කළ, ලැබුණු හෝ වෙනත් ස්ථානයකට මාරු කළ හෝ ව්‍යාපාරයේ විවිධ කොටස් අතර භාණ්ඩ එහා මෙහා කළ අයිතම පිළිබඳ වාර්තා තබා ගැනීම.

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.
2. කළමනාකරණ සහකාර ප්‍රභේදයේ II වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව**

වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ)

**වැටුප් පරිමාණය : JM 1-1**

MM 1-1 රු. [42,600 - 10x775 - 18x1,135 -70,580]

මූලික වැටුප රු. 42,600/= සහ ජීවන වියදම් දීමනාව රු. 7,800/= සහ අයවැය දීමනාව රු. 5,000.00 මාසිකව.

**ඉහත තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය**

ලිඛිත තරඟකාරී විභාගය සහ/ හෝ පත්කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් මෙහෙයවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**සෑම අයදුම්කරුවෙකුම**

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරෙහි රාජකාරී මැනැවින් ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවය සහිත අයකු විය යුතුය.

iii. මනා යහපත් චරිතයකින් හෙබි අයකු විය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ :**

මාසික පැමිණීමේ දිරිදීමනා, ප්‍රවාහන දීමනාව සහ වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ. සෞඛ්‍ය රක්ෂණ ආවරණ ආයතනය මගින් සැපයේ. සේවක අර්ථසාධක අරමුදල සඳහා සමාගම 15% කින් සහ සේවකයා තම වැටුපින් 10% කින්ද සේවක භාරකාර අරමුදල සඳහා සමාගම 3% ත් දායක වනු ඇත.

**අයදුම්පත් ක්‍රියාපටිපාටිය**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහ තම සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත් අධ්‍යාපනික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2024 ජනවාරි 29 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරන "තනතුර" ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය සංස්ථා/ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම,**
**නො. 446, ගාලු පාර, රත්මලාන.**
**0112324466/ 0112437556**
**www.pccl.gov.lk**